කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය එක්ව ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකාව තුළ පලිබෝධනාශක හා පොහොර ආරක්ෂිතව හා නිවැරදි ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් සකසන ලදී.

2025 නොවැම්බර්

# පේර වගාවේ රෝග සහ පලිබෝධ කළමනාකරණය සඳහා ක්ෂේත්‍ර සනීපාරක්ෂක ක්‍රම



ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක සහ පොහොර ආරක්ෂාකාරීව සහ නිවැරදි භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය



## අරමුණ:

පේර යනු අනුරාධපුර, පුත්තලම සහ මාතලේ වැනි ප්‍රදේශවල බහුලව දක්නට ලැබෙන පලතුරකි. ක්ෂේත්‍ර සනීපාරක්ෂාව පවත්වා ගැනීමේ වැදගත්කම පිළිබඳව ඇති නොදැනුවත්භාවය නිසාවෙන් පේර වගා ක්ෂේත්‍රවල රෝග පළිබෝධ තත්වයන් බහුලව නිරීක්ෂණය කළ හැක. උසස් ප්‍රමිතියෙන් යුක්ත ඉහළ අස්වැන්නක් ලබා ගැනීම සඳහා නැතිවම බැරි සාධකයක් ලෙස නිසි ක්ෂේත්‍ර සනීපාරක්ෂාව පවත්වා ගෙන යාම හඳුන්වා දිය හැක.





රූපය 1: වගාවේ පෙර තත්වය (වම් පස) සහ ක්ෂේත්‍ර සනීපාරක්ෂා කටයුතු ක්‍රියාවට නැන්වීමෙන් පසු  තත්වය (දකුණු පස)

## පේර වගාවේ ක්ෂේත්‍ර සනීපාරක්ෂණ ක්‍රම:

### (1) රෝග ආසදනයන්ගෙන් තොර රෝපණ ද්‍රව්‍ය භාවිතය:

- රෝග ආසාදනයන් ගෙන් තොර සහතික කරන ලද නීරෝගීමත් රෝපණ ද්‍රව්‍ය භාවිතා කරන්න.
- නිරෝගී අතු වලින් පැළ කරගත්, පැළ, බීජ වලින් පැල කරගත් පැළ වලට වඩාත් භාවිතයට උචිත වේ.
- ඔබ විසින් බීජ පැළ ලබාගැනීමට අදහස් කරයි නම්, බීජ කැප්ටාන් හෝ තිරාම් වැනි සුදුසු දිලීර නාශකයක් භාවිතා කොට අවශ්‍ය බීජ ප්‍රතිකර්ම කළ යුතුවේ



**රූපය 2:** කැප්ටාන් හෝ තිරාම් භාවිතා කිරීමෙන් බීජ ප්‍රතිකර්ම

### (2) පුද්ගලික සනීපාරක්ෂණය:

ක්ෂේත්‍රයට යාමට පෙර සහ ක්ෂේත්‍රයේ වැඩ කටයුතු අවසන් වූ පසුව සබන් යොදා හොඳින් අත් පිරිසිදු කරන්න. ක්ෂේත්‍රයේ වැඩකිරීමට යාමේදී පිරිසිදු ඇඳුම් අඳින්න. කිසිවිටෙකවත්, රෝග ආසාදිත ශාක කොටස් ඉවත් කිරීමේ දී මීට පෙර අඳින ලද ඇඳුමක් නැවත ඇඳගෙන ක්ෂේත්‍රයේ වැඩ කිරීම නොකරන්න. එසේ කළහොත්, එම රෝග බීජ තැවරුණු ඇඳුම් වලින් අනෙකුත් ශාක ද ආසාදනයට ලක්වීම සිදුවේ.



### (3) පාංශු සනීපාරක්ෂණය:

පස සූර්යාලෝකයට සුදුසු ලෙස නිරාවරණය කිරීම මෙන් අවශ්‍යතාවය අනුව රසායනික ප්‍රතිකාරක් යොදා ගැනීම මගින් අළුහුණු (කැල්සියම් කාබනේට්) යෙදීම තුළින් පස ජීවානුහරණය සිදුකළ හැක.



රූපය 3: සූර්යාලෝකයට නිරාවරනය කිරීම මගින්



රූපය 4: අළු හුණු යෙදීම මගින්

- **කවර (බෑග්) යෙදීම**

කවර යෙදීම නිසා පේර ඵලයේ ගුණාත්මය මෙන්ම පිට පෙනුම වැඩි දියුණුවේ. මේ සඳහා සුදු පැහැති කවර උචිතවේ. ඵල වලට කවර යොදන නිවැරැදි අවස්ථාව පිළිබඳව සැළකිලිමත් වීම වැදගත් වේ. ගෙඩි වර්ධනය වන මුල් අවධියේදී (ආසන්න වශයෙන් විෂ්කම්භය 3-4 තරම් වන ඵලයක්) වන අවධියේදී කවර යෙදීම සිදු කළයුතුය.

කවර යෙදු දිනයන් සටහන් කිරීම ගොවීන් විසින් සිදුකිරීම වැදගත් කටයුත්තක් වන අතර, එවිට කවර යෙදීමෙන් මාස 3කට පසුව අස්වැන්න නෙලිය හැකිවේ. වාණිජ මට්ටමෙන් අළෙවිකරන, කවරවල සටහන්කර ඇති ඉංග්‍රීසි අක්ෂර මත සළකුණු යෙදීමෙන් කවරයෙදු දිනය සොයා ගත හැකිවේ. උදාහරණයක් ලෙස ඉංග්‍රීසි අක්ෂරය A මත X සළකුණු යෙදූ කවර 2025 ජනවාරි 30 දින යෙදූ ඒවා නම් එලෙස සළකුණු කළ සියළු කවර තුළ ඇති ඵල මාස 3 කට පසුව නෙලා ගතයුතුවේ. (පරිණත වී දැයි විවෘත කර බැලීමකින් තොරව)





රූපය 20: ඵල වලට කවර යෙදීම




රූපය 21 : කවර යෙදූ දිනය හඳුනා ගැනීමට ඉංග්‍රීසි අක්ෂරය් මත කතිර සළකුනු යෙදීම

- **වැඩිපුර පවතින ඵල ඉවත් කිරීම (Fruit thinning)**

ඇතැම් විට ගෙඩි හටගැනීම පොකුරු ලෙසින් සිදුවේ. එවිට තනි තනි ඵලයක් සඳහා කවර (බෑග්) යෙදීමට අපහසුය. එමෙන්ම, ඵල දෙකක් ආවරණය වන සේ තනි කවරයක් (බෑගයක්) යෙදීම වැනි ක්‍රියාමර්ග ද ප්‍රායෝගික නොවන්නේ ඵල පරිණත වනවිට ආවරණ බෑගයක ඇති ඉඩකඩ ඵල 2ක් සඳහා ප්‍රමාණවත් නොවන නිසාය. එමනිසා, පොකුරක වැඩිපුර ඇති ගෙඩි මුල් අවධියේ දීම (බෑග් යෙදීමට පෙර) ඉවත් කොට ඉඩකඩ සැකසීම කළයුතුවේ. එවිට ඉහළ ගුණාත්මයෙන් යුතු අස්වැන්නක් ලබා ගත හැකිවේ.



රූපය 19 : වැඩිපුර ඵල ඉවත්කිරීම



### (4) ජලයේ සනීපාරක්ෂණය:

හැම විටම අපවිත්‍ර නොවූ, පිරිසිදු ජලය වගාව සඳහා යොදන්න. ඒසේම, ගසට අවශ්‍ය ප්‍රමාණයට පමණක් ජලය යෙදීම සිදු කරන්න. පමණට වඩා වැඩිපුර ක්ෂේත්‍රයේ ඇති ජලය පහසුවෙන් ක්ෂේත්‍රයෙන් ඉවත්ව යන ලෙස කාර්යක්ෂම ජලවහනයක් තහවුරු කරන්න.



රූපය 5 : බිංදු ජල සම්පාදනය

### (5) උපකරණවල සනීපාරක්ෂණය:

රෝග හා පළිබෝධ ව්‍යාප්තිය වළක්වා ගනිමින් යහපත් ක්ෂේත්‍ර කටයුතු සඳහා භාවිතා කරනු ලබන උපකරණවලට සනීපාරක්ෂණය පවත්වා ගැනීමත් ඉතා වැදගත් වේ. එසේ භාවිතා කරනු ලබන මෙවලම්/ උපකරණ (සපත්තු, ඇඳුම්, උදලු, අලවංගු, පිහි, කප්පාදු කතුරු, වතුර යෙදීමට භාවිතා කරන භාජන) භාවිතයට පෙර සහ පසු හොඳින් සෝදා, විෂබීජහරණය කිරීම සිදුකළ යුතුය. ගෙදර දොරේ සාමාන්‍යයෙන් ඇති, සබන්, රෙදි සෝදන කුඩු හෝ දියර වැනි විෂබීජනාශක් ගුණ ඇති සේදුම්කාරක ද්‍රව්‍යයක් භාවිතා කොට ඉහත කී මෙවලම්/ උපකරණ පිරිසිදු කිරීම වඩා උචිත වේ.



රූපය 6: විෂබීජනාශක යොදාගනිමින් කෘෂි උපකරණ පිරිසිදු කිරීම

### (6) ක්ෂේත්‍ර සනීපාරක්ෂණය

නිසි ක්ෂේත්‍ර සනීපාරක්ෂණයක් පවත්වා ගැනීම, බොහෝමයක් රෝග පළිබෝධයන් මර්ධනය කිරීම සඳහා වඩාත් ඵලදායී ක්‍රමවේදයක් ලෙස සැළකිය හැක. එහිදී රෝග සහ පළිබෝධ ප්‍රභවයන් (ආසාදිත ශාක කොටස්) සහ ක්ෂේත්‍රයේ තුළ මෙන්ම අවට ඇති වල් පැළෑටි අඛණ්ඩව, විධිමත්ව ඉවත් කිරීම, විනාශ කිරීම (පිළිස්සීමෙන් හෝ ගැඹුරින් වළ දැමීමෙන්) සිදු කරනු ලබයි. ක්ෂේත්‍රය තුළ හැකි උපරිම මට්ටමක පිරිසිදුතාවයක් පවත්වාගැනීම තුළින් රෝග හා පළිබෝධ තත්වයන් ඇතිවීම අවම කරගත හැකිවේ. එම ක්ෂේත්‍ර සනීපාරක්ෂණ ක්‍රම අනුගනය කිරීමෙන්, අනෙකුත් ශාක ආසාදනය වළක්වන අතර රෝග/පළිබෝධ ව්‍යාප්තිය සහ වර්ධනය ද සීමා කෙරේ. එබැවින් පහත සඳහන් ක්ෂේත්‍ර සනීපරක්ෂණ පිළිවෙත් පිළිබඳව විශේෂ අවධානයක් ලබාදිය යුතුය.

## ● වගා ක්ෂේත්‍රය අවට පරිසරයෙන් සහ අනෙකුත් වගා ක්ෂේත්‍රයන්ගෙන් වෙන්කිරීම:

පලතුරු වගාවක්, තවත් එවන් පලතුරු වගාවකට මුහුන ලා පිහිටා ඇතිනම්, අනෙකුත් වගාවේ සිට රෝග වාහකයින් පැමිණීම වළක්වා ගැනීමට සැළකිලිමත් වීම වැදගත් වේ. කෘමි ප්‍රතිරෝදී දැල් භාවිතයෙන් වගා ක්ෂේත්‍රය වටකිරීමෙන් එම රෝග වාහකයින්ගේ පැණීම වැළක්විය හැක. බෝගයේ පරිණත උස අනුව කෘමි ප්‍රතිරෝධී දැලෙහි උස මට්ටම තීරණය කළ යුතුවේ.

එසේම, වෙනත් බෝගයක් සඳහා භාවිතා කළ කෘමි ප්‍රතිරෝධී දැලක් භාවිතා කිරීමට අදහස් කරයි නම්, පෙර බෝගයේ පළිබෝධයින් ගෙන් එම දැල ආසාදනය වී තිබිය හැකි නිසා අළුත් වගාවද ආසදනය විය හැක. එවැනි අවස්ථාවකදී, එම ආසාදිත දැල ජීවනුහරණයට සෝඩියම් හයිපොක්ලෝරයිට් යොදා ගැනීම හෝ සූර්ය තාපයෙන් ජීවනුහරණය කළහැක.



රූපය 7:කෘමි ප්‍රතිරෝධී දැල් භාවිතාව

## ● ආසාදිත ශාක කොටස් ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීම

ආසාදිත ශාක සහ ඒවායේ අවශේෂ වගා ක්ෂේත්‍රයේම හෝ ඒ අවට ක්ෂේත්‍රවල තිබෙන්නට ඉඩ හැරීමෙන්, ආසාදනයට හේතුකාරක වන ප්‍රභවයක් සුරක්ෂිතව පවතී. එම නිසා, ක්ෂේත්‍ර අපද්‍රව්‍ය නිසි පරිදි බැහැර කොට විනාශ කිරීම මගින් රෝග සහ පළිබෝධ ව්‍යාප්තිය අවම කරගත හැකිවේ.

ක්ෂේත්‍ර අපද්‍රව්‍ය බැහැර කර විනාශ කිරීමට, වගාවේ සුදුසු කෙළවරක ගැඹුරට හාරන ලද වළක් සකසා ගන්න. බැහැර කරනු ලබන ආසාදිත සහ බෝග අවශේෂ, වල් පැළ, ආදි කොටස් ඒ තුළට දමා පුළුස්සා දැමිය හෝ පස් දමා ගැඹුරින් වළ දමන්න.
සියලුම ආසදිත ශාක කොටස් මෙන්ම බෝග අවශේෂ කොටස්(නිෂ්පාදිතතාවයක් නොමැති අතු සහ පත්‍ර ඇතුළුව) ඉහත කී වලට දමා පුළුසසා දැමීම වැදගත්වේ. ක්ෂේත්‍රයේ හෝ ඒ අවට වෛරස් රෝග ආසාදිත ශාක ඇති බව හඳුනාගත් සැණින්ම, එම සම්පූර්ණ ශාකයම උදුරා ඉවත් කොට පුළුස්සා විනාශ කළ යුතුය. එම ආසාදිත ශාකය තිබු පස අවටත් ප්‍රමාණවත්ව පුළුස්සා ජීවානුහරණය කළ හැකි නම් වඩාත් උචිත වේ.





රූපය 8: අපද්‍රව්‍ය බැහැර කරන් වළ තුළ ආසාදිත ශාක කොටස් පිළිස්සීම



රූපය 9: සියලුම ආසාදිත/ මියගිය ශාක කොටස් ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීම

## ● සැහැල්ලු කප්පාදුව (light pruning)

මුල් කප්පාදුවෙන් සති 3කින් පමණ පසුව, අලුතින් වර්ධනය වූ අතු, ඉති නිසිලෙස කප්පාදු කරලීම සඳහා සැහැල්ලු කප්පාදුවක් සිදුකිරීම වැදගත් වේ. එමගින් වියනෙහි හැඩය තවදුරටත් අවශ්‍ය ආකාරයට හැඩගස්වා ගතහැකි වන අතර වියන ඇතුළතට හොඳ වාතාශ්‍රයක් සහ සූර්යාලෝකයක් ලැබේ.



රූපය 18 : සැහැල්ලු කප්පාදුවෙන් පසුව



## • පොහොර යෙදීම

කප්පාදුවකින් පසුව ගස යම් ආතතියක්ට (පීඩාවකට) පවත්වන අතර, එම තත්වයෙන් මිදීම සඳහා කිසියම් ආකාරයක බලගැන්වීමක් කිරීමට පොහොර යෙදීම වැදගත් වේ. සාමාන්‍යයෙන් පොහොර යෙදීමට පෙර, එම පසේ පෝෂක තත්වය සහ අවශ්‍යතාවය හඳුනා ගැනීම සඳහා පාංශු පරීක්ෂාවක් සිදුකොට අවශ්‍ය පෝෂක ප්‍රමාණය පමණක් ලබාදීම තුළින් පොහොර අවභාවිතය වලක්වා ගත හැක. කාබනික පොහොර යෙදීමේ දී හෙක්ටයාරයකට ආසන්න වශයෙන් ටොන් 10ක් යෙදිය හැක.

ගස වටා පොහොර යෙදිය යුතුවන නිවැරදිම ආකාරය වන්නේ, වියනේ මායිමට සාමාන්තරව පසෙහි නොගැඹුරු කාණුවක් සාදා එයට පොහොර යෙදීමයි. ඉන්පසු පස සමඟ හොඳින් මිශ්‍ර කරන්න. එසේ පොහොර ගසේ කඳට වඩාත් සමීපව නොයෙදිය යුත්තේ, පෝෂක පහසුවෙන් උරාගැනීමට සමත් වන මූල කේශ නොපැවතීමයි. අවධානය යොමුකළ යුතු වැදගත් කාරණාවක් වන්නේ, මෙලෙස පොහොර දැමීම සඳහා භාවිතා කරනු ලබන උදළු වැනි උපකරණ වලින් ගසේ මූල පද්ධතියට සිදු විය හැකි හානි වළක්වා ගැනීමයි. නැතහොත්, හානි වූ මුල් තුළින් රෝග හා පළිබෝධයන් ගසට ඇතුළුවීම සිදුවේ. උදාහරණයක් ලෙස හානි වූ මුල් තුළින් ඉතාම පහසුවෙන් පේර ශාකය මූල ගැටිති නෙමටෝඩා හානියට ගොදුරු වියහැක.



රූපය 16: කාබනික පොහොර යෙදීම

පොහොර යෙදීමෙන් පසුව, ජලය ප්‍රමාණවත්ව යෙදීමෙන් ශාකවලට වඩාත් පහසුවෙන් එම පොහොරවල ඇති පෝෂක අවශෝෂණය කරගැනීමට පහසුකම් සැළසේ.



රූපය 17: කාබනික පොහොර යෙදීම

## • වල් මර්ධනය

වගා ක්ෂේත්‍රය තුළ හෝ ඒ අවට ක්ෂේත්‍රවල ඇති වල් පැළෑටි, ව්‍යාධිජනක බැක්ටීරියාවලට, වෛරස්වලට මෙන්ම හානිකර පළිබෝධකයින්ට (කෘමීන් වැනි) ජීවත්වීමට ඉඩකඩ මෙන්ම බෝහෝ විට පෝෂණ සළසයි. එමෙන්ම, එම වෛරස් ආසාදිත වල් පැළෑටි මත පෝෂණය වන පළිබෝධක කෘමීන් බෝගය මත පෝෂණය වනවිට (යුෂ උරා බී හෝ පත්‍ර මුල් ආදීය කා දැමීමෙන්) එම බෝගයන්ද වෛරස් ආසාදනය වේ. එබැවින්, වගා ක්ෂේත්‍ර වල් පැළ වලින් තොරව පවත්වාගෙන යාම තුළින් එකී රෝග පළිබෝධකයින්ට ජීවත් වීමට සහ පෝෂණය වීමට අවස්ථාව ලබාදීම අවම වේ. එසේම විධිමත් වල් පැළ ඉවත් කිරීමකින්, එකී රෝග වාහක කෘමීන් ආදී පළිබෝධකයින්ට රැඳී සිටීමට ධාරක ශාක නොමැති වීමයි. ඒ අනුව, විධිමත් වල් මර්ධනයක් උසස් ක්ෂේත්‍ර සනීපාරක්ෂණයක් පවත්වා ගැනීමට ඉවහල් වන බව පැහැදිලි වේ. ඉතාම වැදගත් කරුණක් වන්නේ, තණකොළ කපන මැෂිමක් භාවිතයෙන් වල් මර්ධනය සිදුකරන්නේ නම්, එමගින් බෝගයේ කඳට හෝ මුල් වලට හානි නොවීමට වගබලා ගන්න.



රූපය 10: වල් මර්ධනය

## • කප්පාදු කිරීම සහ පුහුණු කිරීම

විශේෂයෙන්ම කප්පාදු කිරීම තුළින් බලාපොරොත්තු වන්නේ (ක්ෂේත්‍ර සනීපාරක්ෂණය තහවුරු කිරීට අදාලව) ශාකයේ අතු ඉති සහිත කලාපය තුළ, එනම් ශාක වියන විහිදා ඇති කලාපය (ශාකයේ පතර විහිදා යන කලාපයේ) ඇතුළත හොඳ වාතනයක් (වාතාශ්‍රයක්) මෙන්ම හිරුඑළිය වැටීම තහවුරු කිරීමයි. ඉහත කී තත්වයන් තහවුරු කිරීම මඟින් ස්වභාවිකව රෝග පළිබෝධකයන්ට වර්ධනය වීමට මෙන්ම ව්‍යාප්ත වීමට ඇති ඉඩක අවම කරනු ලබයි.



රූපය 11: කප්පාදු කිරීමට පෙර තත්වය (වම් පස) සහ පසු තත්වය (දකුණු පස)

### i. කප්පාදු කිරීම සඳහා භාවිතා කරනු ලබන කෘෂිකාර්මික මෙවලම්

කප්පාදු කළයුතු කඳෙහි හෝ අතුවල මහත සහ දැඩිභාවය අනුව, ඒ සඳහා භාවිතා කරන කප්පාදු උපකරණය වෙනස් වේ. විශාලව ඉහළට වැඩුණු මේරූ පේර ගස්, වඩා පහසු උසකට පවත්වාගෙන යාම සඳහා  හොඳින් වැඩුණු විශාල අතු කැපීම සඳහා කප්පාදු කියත භාවිතා කරනු ලබයි. මධ්‍යස්ථ ප්‍රමාණයට වැඩුණු, අතු කැපීම සඳහා ලූපර් උපකරණය (lopper) ද කුඩා අතු කප්පාදු කිරීමට සෙකටියර් (Secateur) ද භාවිතා කරනු ලබයි.



රූපය 12: කප්පාදු කිරීම් සඳහා භාවිතා කරනු ලබන කෘෂිකාර්මික මෙවලම්

කප්පාදු මෙවලමක් එක් ශාකයට භාවිතා කර, තවත් ශාකයක් කප්පාදු කිරීමට යොදා ගැනීමට පෙර, සෑම විටම ජීවානුහරණය කළයුතුවේ. එසේ නොකලහොත්, පෙර ශාකය රෝග ආසාධිත එකක් වුයේ නම්, අනෙක් ශාකයද කප්පාදු මෙවලම හරහා ආසාදනය වේ.

### ii. කප්පාදු ක්‍රම

කප්පාදු කිරීමේ ක්‍රම කිහිපයක් ඇති අතර, පේර වගාව සඳහා ශාකයේ මධ්‍යස්ථ විවෘත කප්පාදු ක්‍රමය  ඉතා යෝග්‍ය වේ .




රූපය 13: ශාකයේ අභ්‍යන්තර විවෘත වන සේ ගස කප්පාදු කිරීම

### iii. කප්පාදුවෙන් පසු රැකබලා ගැනීම

කප්පාදුවෙන් ඇතිවෙන කැපුම් මතුපිට හරහා සිදුවෙන අධික ජල වාෂ්පීකරණය නිසාවෙන් ශාකයට අමතර පීඩාවක් නැතහොත් ආතතියක් ඇති කරයි. එලෙස තුවාල වූ  ස්ථාන පිටත පරිසරයට නිරාවරණය වීම නිසා, ශාකය තුළට රෝග පළිබෝධ ඇතුළු වීමේ හැකියාවක් ද ඇතිවේ. එබැවින්, එම කැපුම් ඉක්මනින් සුවකර ගැනීම සඳහා කැපුම් මතුපිට සුදුසු දිලීරනාශකයක් ආලේප කිරීමෙන් හෝ සුදුසු ඝනකම් දියරමය ද්‍රව්‍යයක් ආලේප කිරීම තුළින් රෝග පළිබෝධ ආසාදනය පාලනය කර ගත හැකි වේ.





රූපය 14: ගසෙහි කැපුම් තුවාල මත ද්‍රාවණයක් ආලේප කිරීම

### iv පුහුණු කිරීම

ගසෙහි අතු රිකිලි, සුදුසු පරිදි හසුරුවා, දිශාගත කිරීම තුළින් (අවශ්‍ය දිශානතියකට යොමු කොට බැඳ දැමීම හෝ බර එල්ලීම  ආදී ලෙස) ගසේ වියන ඇතුළතට (අතුපත්‍ර ඇතුළතට) හොඳ වාතාශ්‍රයක් ලැබීමත්, හොඳින් සූර්යාලෝකය පතිතවීම තහවුරු කළහැකි වේ. එලෙස ගසේ අතු නිවැරදි ස්ථානගත කිරීමට ඒවා ලණු/කම්බි  වලින් ගැටගසා පසට සවිකළ  ලී උල්වල ගැටගැසීම කළ හැක.







රූපය 14: අතු පුහුණු කිරීම